# ජාතක කතා හා කෙටි කතා

මනමේ කුමරියට වැද්දා දුටු පමණින් රාග චේතනාවක් ඇති විය. ඇය වැද්දා දකින තුරු මනමේ කුමරු සමග ප්‍රේමයෙන් බැඳී සිටියේ යැයි මනමේ නාට්‍යයෙන් කියැවෙයි. මනමේ කුමරු හා මනමේ කුමරිය අතර කිසියම් හෝ විරසයක් ඇති වූ බවට සාක්ෂියක් මනමේ නාට්‍යයෙන් සොයාගත නො හැකි ය. එසේ නම් මනමේ කුමරියට මනමේ කුමරු අත්හැර යෑමට එවැනි කිසි ම හේතුවක් තිබී නැත. යම් ආකාරයකින් මනමේ කුමරිය මනමේ කුමරු සමග කිසියම් හෝ කරුණකට උරණ වී සිටියේ නම් එවිට ඇයට කුමරු අත්හැර යෑමට යම් හේතුවක් තිබිණි යැයි සිතිය හැකි ය.

මෙයින් අදහස් කරන්නේ යම් හේතුවක් තිබූ පමණින් බිරිඳකට සැමියා හෝ සැමියකුට බිරිඳ හෝ අත්හැර දැමීමට අවසර ඇතැ යි යන්න නො වන බව අමුතුවෙන් කිවයුතු වන්නේ මේ ලිපි කියවන්නන් අතර මන්දබුද්ධිකයන් ද සිටින බව එයට ලැබෙන ඇතැම් ප්‍රතිචාරවලින් හෙළිදරවු වන බැවින් ය. මාර්ටින් වික්‍රමසිංහ මහතා අභිධර්මය නිවැරැදිව නො දත් බව පෙන්වන උදාහරණ පසුව ඉදිරිපත් කරන්නේ යැයි කීමෙන් ඒ සාධක ඊළඟ සතියෙහි ම ඉදිරිපත් කරන බවක් නො කියැවෙන බව මන්ද බුද්ධිකයකුට නොවැටහිය හැකි නමුදු සාමාන්‍ය බුද්ධියක් ඇති කුඩා ළමයකුට වුව ද වැටහෙයි. සමාජය යක්කඩුවේ හාමුදුරුවන් නො පිළිගෙන මාර්ටින් වික්‍රමසිංහ මහතා පිළිගැනීමෙන් අගෞරවයක් වන්නේ සමාජයට මිස යක්කඩුවේ හාමුදුරුවන්ට නො වෙයි. ඒ බව ඇතැමුන්ට නො වැටහෙයි.

අද සමාජය යක්කඩුවේ හාමුදුරුවන් නො පිළිගන්නේ, පිළිගත යුත්තේ කවුරුන් ද යන්න තීරණය කෙරෙන්නේ බටහිර සංස්කෘතික යටත්විජිතවාදය විසින් බැවිනි. එය උන්වහන්සේට හා සඟ පරපුරට කරන අගෞරවයක් නො වන බව මන්දබුද්ධිකයනට නො වැටහෙයි. අපට අවශ්‍ය වන්නේ බටහිර සංස්කෘතික යටත්විජිතවාදය පරාජය කර යක්කඩුවේ හාමුදුරුවන් හා අනෙක් භික්ෂූන්වහන්සේට ඒ ලැබිය යුතු පිළිගැනීම ලබා දීමට ය. එහෙත් ඒ පහසු කාර්යයක් නො වන බව අපි දනිමු. අද ඇති සංස්කෘතික අච්චාරුවෙන් මන්දබුද්ධිකයන් පමණක් නො ව බොහෝ උගතුන් ද අන්දමන්ද වී ඇත. බටහිරින් දැනුම අවශෝෂණය කෙරෙනු වෙනුවට සාහිත්‍ය ක්ෂෙත්‍රයෙහි බටහිර අනුකරණය කිරමට මාර්ටින් වික්‍රමසිංහ මහතාට ද සිදු වුයේ මේ අච්චාරු සංස්කෘතිය හේතු කොටගෙන ය. ජේද කිහිපයක් නිරවල් ව සංගත ව ලිවීමට නොහැකි මන්දබුද්ධිකයන්ගේ ප්‍රතිචාරවලට පිළිතුරු ලිවීම කාලය, ශ්‍රමය මෙන් ම පුවත්පතේ ඉඩ ද කා දැමීමකි. කැමරාවක් ඇල්ලූ පමණින් පෑනක් ඇල්ලිය නොහැකි බව ඇතැමුනට නො වැටහෙයි.

මනමේ නාට්‍යයෙහි මනමේ කුමරිය මනමේ කුමරු හා බැදෙන්නේ රාගය හේතු කොටගෙන මිස වෙනත් කරුණක් නිසා නො වන බව නාට්‍යයෙන් කියැවෙයි. මේ ක්‍රියාවට අනුකම්පා කිරමෙන් අප කරන්නේ රාගයට අනුබල දීමකි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි පුද්ගලයන්ගේ ඉන්ද්‍රිය පිනවීමට අනුබල ලැබෙන අතර ඒ තව තවත් වර්ධනය ද කෙරෙයි. ඉන්ද්‍රිය පිනවීම හඹා යන බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි පුද්ගලයකුට ඒ සඳහා ඉඩකඩ ඇහිරෙන්නේ එමගින් වෙනත් පුද්ගලයකුගේ නිදහස නැති වන්නේ නම් ය. එහි යම් පුද්ගලයකුට තවත් පුද්ගලයකු සමග රාගික ක්‍රියාවන්හි බලහත්කාරයෙන් බැදිමට නො හැකි ය. එහෙත් ඒ දෙවැන්නා ද එයට එකඟ නම් එසේ බැදීමෙහි වරදක් නැත යන ස්ථාවරයට බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ක්‍රමයෙන් ගමන් කරමින් සිටියි.

මෙහි දී බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් ඒ බැදීම හේතු කොටගෙන සිදුවිය හැකි අනෙක් ප්‍රතිඵල ගැන අවධානය යොමු නො කෙරෙයි. විවාහක සැමියකු හෝ බිරිඳක හෝ වෙනත් කතක හෝ පිරිමියකු හෝ සමග ඇසුරක් පවත්වාගෙන යැමෙන් අවසානයේ දී ඒ විවාහක යුවලකගේ දරුවන්ට කුමක් වේ ද යන ප්‍රශ්නය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අදාළ නැත. එවැනි ඇසුරක් නිසා පවුලට වන විපත හා පොදුවේ ඒ සමාජයට බලපාන අන්දම බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් සාකච්ඡා නො කෙරෙයි. එහි දී වැදගත් වන්නේ පුද්ගලයාට ඇති ඊනියා නිදහස ය. පුද්ගලයා සමාජයට ඉහළින් සැලකෙන සංස්කෘතියක එවැනි දෙයක් වීම පුදුමයක් නො වෙයි. අද බටහිර සමාජය පරිනාමණය වන්නේ යහපත් දිශාවකට නො වෙයි.

© Prof. Nalin De Silva

අප මනමේ කුමරියගේ ක්‍රියාවට අනුකම්පා කරන්නේ නම් ඉන් කියැවෙන්නේ ඕනෑ ම මොහොතක ඇඳුම් මාරු කරන්නාක් මෙන් සැමියා හෝ බිරිය හෝ අත්හැර දමන්නන්ට අප අනුකම්පා කළ යුතු බව ය. එහෙත් මෙහි දී ඇතැමුන් කියනු ඇත්තේ මනමේ නාට්‍යයෙහි අනුකම්පාව දැක්වෙන්නේ මනමේ කුමරියට මිස ඇගේ ක්‍රියාවට නො වන බව ය. එහෙත් නාට්‍යයෙන් එවැන්නක් සිතා ගැනීමට අපට ඉඩක් නො ලැබෙයි. මනමේ කුමරියගේ ක්‍රියාව ඇගෙන් වෙන් කිරමට නො හැකි ය. පුද්ගලයකු යනු පුද්ගලයකුගේ ක්‍රියාවල එකතුවකි. එබැවින් පුද්ගලයකුට අනුකම්පා කිරම යනු අවසානයේ දී ඒ පුද්ගලයාගේ ක්‍රියාවලට අනුකම්පා කිරමකි. මනමේ කුමරියට අනුකම්පා කිරමේ දී ඇගේ ක්‍රියාවන්ට ද, විශේෂයෙන් ම මනමේ කුමරු අත්හැර වැද්දා සරණ යැමට පැතීම ගැන ද අනුකම්පා කළ යුතු වෙයි.

එහෙත් මෙහි දී ඇතැමකු මේ සිද්ධියට වෙනත් අර්ථකථනයක් දෙනු ඇත. තමා අසරණ වේ යැයි සිතූ මනමේ කුමරිය කඩුව වැද්දාට දීමට කල්පනා කරන්නට ඇතැයි ඒ අර්ථකථනයෙන් කියැවෙයි. එහෙත් එය නොපිළිගත හැකි කරුණක් වනුයේ මනමේ කුමරු කඩුව අතට ගත්තේ නම් වැද්දා මිය යැම නියත වන බැවිනි. වැද්දා අතට කඩුව දීමට මනමේ කුමරියට අවශ්‍ය වුයේ ඇය වැද්දාගේ සිරුරට ලොල් වූ බැවින් මිස අනෙක් කරුණක් නිසා නො වන බව පැහැදිලි ය. ඇගේ චරිතයට අනුකම්පා දැක්වීම යනු කිනම් තත්ත්වයක් යටතේ හෝ ඉන්ද්‍රිය පිනවීමට අනුබල දීමකි.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පුද්ගලයන්ගේ ඉන්ද්‍රිය පිනවීමට අනුබල දෙයි. එහි එක් ඵලයක් වූ ධනපති ක්‍රමය වර්ධනය වන්නේ ද මෙලෙස මිනිසුන්ට ඉන්ද්‍රිය පිනවීමට අවස්ථාව සලසා දීමෙනි. පුද්ගලිකත්වය හා පුද්ගලයන්ගේ ඉන්ද්‍රිය පිනවීම වර්ධනය කිරම නො වන්නට ධනපති ක්‍රමයට පැවැත්මක් නැත. පුද්ගලයා අනෙක් පුද්ගලයන්ගෙන් හා සමාජයෙන් ද, පරිසරයෙන් ද වෙන් කළ විට එක් පැත්තකින් ගත් කල පුද්ගලයකුට ඉතිරි වන්නේ ශ්‍රමය පමණකි. අනෙක් පැත්තෙන් පුද්ගලයාට තම ඉන්ද්‍රිය පිනවීමට අවස්ථා සලසා දීම මගින් හා පුද්ගලයාට ස්වභාවය හා පරිසරය අභිබවා යැමට අනුබල දීමෙන් බටහිර ක්‍රිස්ත්‍රියානි නූතනත්වය පුද්ගලයන්ගේ ශ්‍රමය වැය කර විවිධ භාණ්ඩ නිෂ්පාදනය කිරිම සඳහා වාතාවරණයක් සපයයි.

එහෙත් සමාජයට ඒ ආකල්ප සහිත ව කෙතෙක් දුරට පැවැතිය හැකි ද යන ප්‍රශ්නය ද ඒ සමග මතු වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අවුරුදු පන් සියයක පමණ කාලයක් තිස්සේ විවිධ භාණ්ඩ නිෂ්පාදනය කර ඇති බව පැහැදිලි ය. එහෙත් ඒ සඳහා මිනිසුන් ගෙවා ඇති වන්දිය ඉතා විශාල ය. අද පරිසරය රැකගැනීම යනුවෙන් වෙන ම ප්‍රශ්නයක් ඇති වී තිබෙන්නේ ඉන්ද්‍රිය පිනවීමට සීමාවන් පනවා ගැනීමට බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අසමත් වී තිබීම හේතු කොටගෙන ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි පරිසරය රැකගැනීම යන්න ම විහිළුවකට වඩා දෙයක් නො වේ. අසීමිත ව ඉන්ද්‍රිය පිනවීමට ශක්තිය වැය කළ යුතු ය. ශක්තිය ලැබෙන්නේ පරිසරයෙනි. පරිසරය විනාශ නො කර බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට ඊනියා දියුණුවක් අත් කරගත නොහැකි ය.

ඉන්ද්‍රිය පිනවීමට සීමාවන් තිබිය යුතු ය. පැරණි සමාජයෙහි, පෙරදිග මෙන් ම අපරදිග ද ඒ ඒ සංස්කෘතීන් විසින් ඒ සීමාවන් ඇති කිරමට කටයුතු කෙරිණි. පැරණි භාරතයේ ප්‍රාග් වෛදික, බෞද්ධ, ජෛන, කොන්ෆියුෂියස්, කතෝලික, පැරණි ඇමෙරිකාවේ මායා ආදී සංස්කෘතීන් විසින් ඉන්ද්‍රිය පිනවීමට විවිධ සීමාවන් පනවනු ලැබ තිබීමෙන් පෙන්නුම් කරන්නේ පැරැන්නන්ට මේ පිළිබඳ යම් අවබෝධයක් තිබූ බව ය.

මෙරට සංස්කෘතිය ගොඩනැගීමේ දී ජාතක කතා විශාල කාර්යභාරයක් කර ඇති බව පැහැදිලි ය. ජාතක පොත කවදා ලියුව ද ජාතක කතා සිංහල බෞද්ධයන්ට බෞද්ධ සාරධර්ම ඉගැන්වීමට ඉහත සිට ම යොදා ගැනුණු මාධ්‍යයක් වී යැයි සිතිය හැකි ය. ජාතක කතා වැනි කතා වෙනත් සංස්කෘතීන්හි ද තිබූ බව අමතක නො කළ යුතු ය. සිංහල බෞද්ධයන්ගේ ආදර්ශවත් චරිතය වුයේ බෝසතාණන් වහන්සේ ය. උන්වහන්සේ ලෝක සත්ත්වයාගේ යහපත සඳහා අවුරුද්දක්, දෙකක්, ජීවිත කාලයක් නො ව, සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් සසර සැරිසැරූ හ. සුමේධ තාපසයන් ලෙස පුද්ගල විමුක්තිය ලබා ගැනීම සඳහා රහත් වීමේ අවස්ථාව බෝසතාණන් වහන්සේට තිබූ නමුත් උන්වහන්සේ සත්ත්වයනට පතළ කරුණාවෙන් සසර සැරිසැරමට ඉටා ගත් හ.

සිංහල බෞද්ධයන්ට වීර චරිත බෝසතාණන් වහන්සේ ගේ විවිධ ජන්මවලින් සොයාගත හැකි විය. ඒ ඒ තැනැත්තාට ගැලපෙන පරිදි ඒ ඒ ජාතකයෙහි බෝසතාණන් වහන්සේ වීරයා ලෙස තෝරාගත හැකි විය. බෝසත් චරිතය මෙරට

© Prof. Nalin De Silva

කෙතරම් බලපෑමක් කළේ ද යත්, ජාතක පොත ලිවීමට බොහෝ කලකට පෙර ම මෙරට රජ වන තැනැත්තා බෝධිසත්ත්වයකු විය යුතු ය යන සංකල්පය ගොඩනැගී තිබුණි. සිංහල රජවරුන් යොදාගත් ප්‍රියතම නමක් වූයේ අග්‍රබෝධි යන්න ය. ජාතක කතා කෙතරම් සමාජයේ මුල් බැසගෙන තිබුණි ද යත් ඒ පොතක් ලෙස සකස් කිරමේ අවශ්‍යතාව ද පසුව පැනනැගී ඇති බව පැහැදිලි ය. එහෙත් එයට පෙර ද සසදාවත, මුවදෙව්දාවත ආදී කෘති නිර්මාණය වීමෙන් පෙන්නුම් කරන්නේ ජාතක කතා ජනතාවට කෙතරම් සමීප වී ද යන්න ය.

ජාතක පොතෙහි ලියැවී ඇත්තේ ජාතක කතා ය. මේ කතාවල අරමුණ වූයේ ජාතිය යහ මග යැවීම ය. යහ මග යන්න ඒ ඒ සංස්කෘතියට සාපේක්ෂ වෙයි. සිංහල බෞද්ධයන්ගේ යහ මග හා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි යහ මග යනු දෙකක් මිස එකක් නො වෙයි. ජාතක පොත පමණක් නො ව ජාතක කතා ද එක් පැත්තකින් ගත් කල සිංහල සාහිත්‍යයට අයත් වෙයි. සාහිත්‍යය යනු ලියැවී ඇති කෘති පමණක් නො වේ. ලියැවී ඇති සාහිත්‍යයට අවශ්‍ය නම් ලිඛිත සාහිත්‍යය යැයි කිව හැකි ය. නො ලියැවුණු සාහිත්‍යය වාචික සාහිත්‍යයක් වෙයි.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි මෙන් නො ව සිංහල බෞද්ධ සංස්කෘතියෙහි වාචික ව හෝ ලිඛිත ව හෝ පැවති මෙන්ම පවතින කතා යනු හුදු කතා පමණක් නො වේ. බටහිරයෝ අද නව කතාව, කෙටි කතාවෙන් ද, ඒ දෙක ම මිනිසුන් ගේ සාරධර්මවලින් ද වෙන් කරති. මේ වෙන් කිරම මතුපිටින් කෙරෙන්නකි. ගැඹුරින් සලකා බැලූ විට ඒ වෙන් කිරම පිටුපස ඒ සියල්ල එකතු කරන චින්තනයක් ඇති බව පෙනී යයි. සිංහල බෞද්ධයන්ට එසේ මතුපිටින් කරන වෙන් කිරමක් හෝ අවශ්‍ය නො විණි. ජාතක කතා හුදු කතා පමණක් නො ව ජාතියේ සාරධර්ම ද ලකුණු කර දුන් කතා ද විය. ජාතක කතා හා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි බිහි වූ කෙටි කතා අතර ඇති මේ වෙනස අප මුලින් ම තේරුම්ගත යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva